// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 1904/10 - 2015 මාර්තු මස 03 වැනි අඟහරුවාදා - 2015.03.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 1/2012 (II).

### 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1) (ඌ) වන වගන්තිය යටතේ ස්වදේශ කටයුතු සහ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ජෝශප් මයිකල් පෙරේරා,
ස්වදේශ කටයුතු සහ ධීවර අමාත්‍ය.

2015 පෙබරවාරි මස 28 වැනි දින.
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2015 අංක 1 දරන ධීවර ආම්පන්න ලකුණු කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ධීවර යාත්‍රාවක සෑම හිමිකරුවකු ම හෝ ක්‍රියාකරුවකු ම එම ධීවර බෝට්ටුවේ ගෙනයනු ලබන සියලුම වර්ගවල කරමල් දැල්, වට කරන දැල්, මසුන් ඒකරාශි කිරීමේ ඇටවුම්, මත්ස්‍ය උගුල්, ජා කොටු සහ සියලුම වර්ගවල මරුවැල් ද ඇතුලුව සියලුම ධීවර ආම්පන්න මෙහි 1 වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි සළකුණු කළ යුතු ය.

3. (අ) ධීවර ආම්පන්නය කොඩියක් හෝ සංකේතාත්මක හැඳුනුමක් භාවිත කිරීමෙන් සළකුණු කළ යුතු අතර ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කළ යුතු ය. එම සළකුණු කිරීම ස්ථිර එකක් විය යුතු ය.

(ආ) සළකුණු කිරීම සඳහා යොදා ගනු ලබන සෑම කොඩියක් ම උසින් සෙන්ටිමීටර් විසිපහකට සහ පළලින් සෙන්ටිමීටර් තිස්පහකට අඩු නොවිය යුතු ය. සළකුණු කිරීම සඳහා කොඩි දෙකක් අවශ්‍යවන අවස්ථාවල දී එම කොඩි දෙක අතර දුර සෙන්ටිමීටර් දහයකට නොඅඩු විය යුතු අතර සෑම කොඩියක් ම ජලයට ප්‍රතිරෝධී ආකාරයට සහ ප්‍රතිදීප්ත වර්ණවලින් සකස් කර ගනු ලැබිය යුතු ය.

4. සළකුණු කිරීම සඳහා යොදාගනු ලබන සෑම සංකේතාත්මක හැඳුනුමක්ම අවශ්‍ය ජල ප්‍රතිරෝධී සහ කල්පවතින ආකාරයෙන් විය යුතු අතර, සියලුම මුහුදු තත්වයන් හි දී ධීවර ආම්පන්නයට සවි වී පැවතියහැකි විය යුතු ය.

5. ධීවර ආම්පන්නයේ සළකුණු කිරීම් කළු පැහැති පසුබිමක සුදු පැහැ වර්ණයෙන් හෝ සුදු පැහැති පසු බිමක කළු වර්ණයෙන් පහසුවෙන් කියවිය හැකි හෝ හඳුනාගත හැකි ආකාරයෙන් වෙන් වෙන් අකුරුවලින් පළාතේ භාෂාව භාවිතය පදනම් කොට එක් රාජ්‍ය භාෂාවකින් සහ ඉංග්‍රීසි භාෂාවෙන් සිදු කළ යුතු ය.

1A - PG2386— 1502 (2015/03)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

6. සළකුණු කිරීම් ධීවර ආම්පන්නය ක්‍රියාත්මක කිරීම සහ එහි ක්‍රියාකාරිත්වය කෙරෙහි බාධාවක් ඇතිවීම වළක්වනු ලබන ආකාරයකින් සැලසුම් කිරීම සහ ස්ථානගත කිරීම කළ යුතු ය.

7. ධීවර ආම්පන්නයට සවි කර ඇති කොඩියේ හෝ සංකේතාත්මක හැඳුනුමේ යාත්‍රාවේ කැඳවුම් සංඥාව, යාත්‍රාවේ නම, යාත්‍රාව ලියාපදිංචි කර ඇති වරාය, ධීවර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද යාත්‍රාවේ ලියාපදිංචි අංකය, යාත්‍රා හිමියාගේ සහ යාත්‍රා ක්‍රියාකරුගේ නම සළකුණු කළ යුතු ය.

8. මෙහි II වන උපලේඛනයේ අදාළ ධීවර ආම්පන්නය සඳහා සඳහන් කර ඇති සංකේතය කොඩියේ හෝ සංකේතාත්මක හැඳුනුමේ සළකුණු කළ යුතු ය.

9. (1) ධීවර ආම්පන්නය පහත පරිදි සළකුණු කළ යුතු ය -

(i) සළකුණු කිරීම සඳහා යොදා ගනු ලබන සෑම සංකේතාත්මක හැඳුනුමක්ම උසින් අඟල් හතරක් සහ පළලින් අඟල් හයක් විය යුතු අතර, 7 වන නියෝගයේ නිශ්චිත ව දක්වා ඇති සියලු විස්තර එහි දෙපැත්තේ ම මුද්‍රණය හෝ කැටයම් කළ යුතු ය.

(ii) සෑම සංකේතාත්මක හැඳුනුමක් හෝ කොඩියක් ම සුදු පැහැති පසුබිමක කළු වර්ණයෙන් හෝ කලු පැහැති පසුබිමක සුදු වර්ණයෙන් ප්‍රතිදීප්ත වර්ණවලින් මුද්‍රණය කළ යුතුය.

(2) 5 වන නියෝගයට යටත් ව සෑම සංකේතාත්මක හැඳුනුමක් හෝ කොඩියක් ම ප්‍රතිදීප්ත වර්ණ යොදා පින්තාරු කළ යුතු අතර, ධීවර ආම්පන්නයට ස්ථිර ලෙස සවි කළ යුතු ය.

10. ධීවර ආම්පන්න අත්හැර දැමීමක් හෝ නැතිවීමක් සිදු වූ සෑම අවස්ථාවක් පිළිබඳ ව වහාම ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ධීවර බෝට්ටුවේ හිමිකරු හෝ ප්‍රධානියා විසින් දැනුම් දිය යුතු ය.

11. ධීවර ආම්පන්න මගින් විශේෂයෙන් ම -

*(අ)* ජලය මතුපිට සහ ජලය යටින් සිදුවන බෝට්ටු ගමන් කිරීම සඳහා අනතුරක් ඇති කරනු ලබන විට ;
*(ආ)* නීති විරෝධී ලෙස කොරල්පර වලට හානි සිදු කරනු ලබන විට ;
*(ඇ)* මසුන් බෝවන ස්ථානවලට නීති විරෝධී ක්‍රියා සිදු කරනු ලබන විට ;
*(ඈ)* මසුන් ඇල්ලීම සඳහා බාධාවක් ඇති කරනු ලබන විට හෝ ;
*(ඉ)* කැඩී ගිය හෝ අත්හරිනු ලබන ධීවර ආම්පන්නවලට මසුන් අසු වීම අඛණ්ඩව සිදුවන විට,

යාත්‍රාවේ කාර්ය මණ්ඩලය, හිමිකරු හෝ ක්‍රියාකරු විසින් නැති වූ හෝ අත්හැර දමන ලද ධීවර ආම්පන්න ආපසු ලබා ගැනීම සඳහා සෑම උත්සාහයක්ම ගනු ලැබිය යුතු ය.

12. මෙම නියෝගවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස -

"නීති විරෝධි ලෙස කොරල්පරවලට හානි සිදු කිරීම" යන්නෙන් මුහුදේ දී භාවිත කරනු ලබන කැඩී ගිය හෝ අත්හරිනු ලැබූ ධීවර ආම්පන්නවලින් කොරල් පරවලට සිදුවන හානිය අදහස් වේ.

"මසුන් බෝවන ස්ථානවලට සිදු කරනු ලබන නීති විරෝධී ක්‍රියාව" යන්නෙන් මුහුදේ දී භාවිතා කරන කැඩී ගිය හෝ අත්හරිනු ලැබූ ධීවර ආම්පන්න මගින් මසුන් බෝවන ස්ථානවලට කරනු ලබන හානිය අදහස් වේ.

"ගෝස්ට් ෆිෂින් (ghost fishing)" යන්නෙන් මුහුදේ දී කැඩී ගිය හෝ අත්හරිනු ලබන ධීවර ආම්පන්නවලට අඛණ්ඩව මසුන් අසුවීම අදහස් වේ.


## පළමුවැනි උපලේඛනය

1. ධීවර ආම්පන්න සලකුණු කිරීම සඳහා උදාහරණ


1. ටැග්


| |
|---|
| බෝට්ටුවේ ලියාපදිංචි අංකය : |
| බෝට්ටුවේ නම : |
| ලියාපදිංචි වරාය : |
| ඇමතුම් සංඥාව : |
| IMO අංකය : |
| හිමිකරු/හිමිකරුවන් : |
| හිමිකරුගේ/හිමිකරුවන්ගේ ලිපිනය : |
| ක්‍රියාකරු/ක්‍රියාකරුවන් : |
| ක්‍රියාකරුගේ/ක්‍රියාකරුවන්ගේ ලිපිනය : |


2. කොඩි





3. බෝයාව මත හා ආලෝක බෝයා (බීකන් පහන්) මත හඳුනාගැනීමේ සලකුණු, ටැග් හා කොඩි ස්ථානගත කිරීම.










ඉපිලුම
Floating






V3XXX

**II** වන උපලේඛනය

ධීවර ආම්පන්න/පන්න ක්‍රම සඳහා සංකේත

*එලන දැල් සහ වටකරන දැල්*

| | | | |
|---|---|---|---|
| පාවෙන කරමල් දැල් - විශාල ඇස් සහිත | GNLM | මාදැල් | SNBS |
| පාවෙන කරමල් දැල් - කුඩා ඇස් සහිත | GNSM | වටකරන දැල් | SNRN |
| පතුලේ එලන කරමල්දැල් | GNBS | පසුම්බි දැල් | SNPS |
| ත්‍රිත්ව දැල් | GNTR | වට කරන දැල්(වාච්චල්) | SNWD |
| කොටු දැල් | GNKD | මායාවලෙයි | SNMV |
| හරස් දැල් | GNHD | | |

*මරුවැල් සහ අත්යොත්*

| | | | |
|---|---|---|---|
| දුවන පන්නය | HLTR | පතුලේ මරුවැල් පන්නය | HLBL |
| බල ඔරු පන්නය | HLPL | අත්යොත් පන්නය/පිත්ත හා යොත | HLRL |
| අත්යොත් පන්නය | HLHL | රිටි පන්නය | HLST |
| මෝරමරුවැල් පන්නය | HLSL | දැල්ලන් පන්නය | HLSJ |
| කෙලවල්ලන් මරුවැල් පන්නය | HLTL | | |

| *ට්‍රෝල් දැල් සහ අදින දැල්* | | *ඔසවන දැල්, කකුළු තට්ටය සහ උගුළු* | |
|---|---|---|---|
| ඉස්සන් ට්‍රෝලින් | DNST | ඔසවන දැල් | LNBT |
| ඇදගෙන යන දැල් | DNBT | ඔසවන දැල් (ගොඩබිම සිට) | LNSH |
| කලපු දැල් (ගාවන දැල්) | DNGD | කකුළු තට්ටිය | LNCR |
| කඩිප්පුව | DNKD | මත්ස්‍ය උගුල් | TRFS |
| ගොක් රැන් දැල් | DNGR | විසිදැල් | FGCN |
| අදින දැල (කලපු ට්‍රෝල්) | DNSLT | ජාකොටු දැල් | TRKR |
| | | කරක්ගෙඩිය | TRCP |
| | | මස්අතු දැල් | TRBP |
| | | කට්ටු දැල් | TRKD |

*වෙනත් වර්ග*

| | | | |
|---|---|---|---|
| අතංගුව | MSSC | මන්දාව | MSHP |
| කිමිදීම | MSDV | හෙල්ලයෙන් මැරීම | MSSF |
| | | පිලඅතුපන්නය (දැල්ලන්) | MSFF |

03-501

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.